# ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

# කොළඹ

## පුවත්පත් නිවේදනය

### ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් පවත්වන ලද ITEC දින සැමරුමේදී අධ්‍යාපන සහ කුසලතා පුහුණු ක්ෂේත්‍රයන්හි සහයෝගීතාවය වර්ධනය කරගැනීමට ඉන්දියාව සහ ශ්‍රී ලංකාව එකඟ වේ.

ඉන්දියානු තාක්ෂණික සහ ආර්ථික සහයෝගිතා වැඩසටහන (ITEC) හරහා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ධාරිතා සංවර්ධන සහයෝගිතාවයේ 58වන වසර නිමිත්තෙන් කොළඹ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් සංවිධානය කරන ලද ITEC දිනය 2022 සැප්තැම්බර් මස 28 වන දින කොළඹ දී පැවැත්විණ.

2. ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා ද ගෞරවනීය අමුත්තා ලෙස අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් නිහාල් රණසිංහ මහතා ද සහභාගී වූහ. තවද මෙම උත්සවය සඳහා 100කට අධික පිරිසක් සහභාගී වූ අතර එයට ශ්‍රී ලංකාවේ ITEC ශිෂ්‍යත්වලාභීන්, ITEC වැඩසටහන් යටතේ ඉන්දියාවේ විවිධ පුහුණු පාඨමාලා සඳහා සහභාගී වූ විවිධ ක්ෂේත්‍රයන්හි නිලධාරීන් සහ වෘත්තිකයන් ඇතුළත් විය.

3. මෙම අවස්ථාව අමතමින් අධ්‍යාපන අමාත්‍යතුමා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින වසර දෙදහසකටත් වඩා පැරණි සමීප සබඳතාවය පිළිබඳව අදහස් දැක්වීය. ඉන්දියාව විසින් ශ්‍රී ලාංකිකයන්ට ලබා දෙන ITEC පුහුණු අවස්ථා සහ වාර්ෂික ශිෂ්‍යත්ව අගය කළ එතුමා පසුගිය මාසවලදී ඉන්දියාව විසින් ලබා දුන් මූල්‍ය සහයෝගයට සිය කෘතවේදීත්වය පළ කළේය. උසස් අධ්‍යාපනය, විශේෂයෙන්ම විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය (STEM) සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය තුළ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සහයෝගීතාවය තවදුරටත් වර්ධනය කිරීම සඳහා පවතින අවස්ථාවන් එතුමා විසින් අවධාරණය කරන ලදී. එතුමා ඉන්දියාවේ පුළුල් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ සිසුන්ට සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයට එහි ඇති ප්‍රතිලාභ පිළිබඳව ද සඳහන් කළේය.

4. මෙම අවස්ථාවේදී අදහස් දැක්වූ මහ කොමසාරිස්තුමා ශ්‍රී ලාංකික නිලධාරීන් ITEC වැඩසටහන සඳහා විශාල උනන්දුවක් දක්වන බව සඳහන් කළේය. ITEC සහයෝගීතාවයේ වැදගත්කම අවධාරණය කළ එතුමා අධ්‍යාපන සහ කුසලතා පුහුණු ක්ෂේත්‍රය තුළ ඉන්දු - ශ්‍රී ලංකා සහයෝගීතාවය සඳහා සීමාව 'අහස' යැයි ප්‍රකාශ කළේය. ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආයතන අතර සහයෝගීතාවය තුළු පියවර හරහා ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා උපකාර කිරීමට ඉන්දියාව දක්වන ප්‍රයත්නයන් මහ කොමසාරිස්තුමා විසින් මෙහිදී පෙන්වා දෙන ලදී. තව ද දැනට පිරිනමන ITEC අවස්ථා 402ට අමතරව ඉන්දියාව විසින් සෑම වසරකම ශිෂ්‍යත්ව 700ක් පමණ ලබා දේ.

5. සහභාගී වූ පිරිස ඉන්දියාවේ තම ITEC අත්දැකීම් බෙදාගත් අතර විවිධ ITEC වැඩසටහන්හි සාරවත් අන්තර්ගතය අගය කළහ. බෙංගලාරු හි විද්‍යා  යතනයේ දී "විද්‍යාව, තාක්ෂණය සහ නව්‍යකරණ ප්‍රතිපත්ති" පිළිබඳව ITEC පුහුණු වැඩසටහනකට සහභාගී වූ ශ්‍රී ලංකා කාර්මික තාක්ෂණ  යතනයේ පර්යේෂණ සහ සංවර්ධන අතිරේක ලේකම් මහාචාර්ය ඉල්මි ගංගා හේවාජුලිගේ මහත්මිය

ITEC වැඩසටහන "දැනුම් සහ අත්දැකීම් පැකේජයක්" බව සඳහන් කළාය. ප්‍රතිපත්ති සම්පාදනය සහ I-STEM පිළිබඳව රැස් කරගත් තොරතුරු ඉතා වැදගත් බව සහ එයින් උගත් දේ දැනටමත් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කර  ති බව ද   අනුව ශ්‍රී ලංකාවේ ජාතික විද්‍යා පදනම I-STEM පිළිබඳව ඉන්දියානු පද්ධතිය හා සබැඳි එවන් සංකල්පයක් ක්‍රියාවට නංවා  ති බව ද එතුමිය සඳහන් කළාය. නව දිල්ලි හි ශාන්ත ස්ටීවන් විද්‍යාලයේ දී පැවති අසල්වැසි රටවල තරුණ නායකයන්ගේ වැඩසටහනක් සඳහා සහභාගී වූ සන්ෂයින් හෝල්ඩින්ස් පී. එල්. සී හි සයිබර්  රක්ෂාව සහ  අනුකූලතාවය පිළිබඳ කළමනාකරු රිෂාඩ් අක්‍රම් රාෆි මහතා  ර්ථික විද්‍යාව, ව්‍යවස්ථාවන්, ප්‍රතිපත්ති සැලසුම්, දේශපාලන විද්‍යාව, සෞඛ්‍ය සේවා සහ නීතිය වැනි විවිධ ක්ෂේත්‍රයන්හි ඔහු ලද දේශන සහ අත්දැකීම් විස්තර කළේය. නොයිඩා හි ජයිපූරියා කළමනාකරණ  යතනය විසින් පවත්වන ලද "නව්‍යකරණ  යතන සඳහා නවමු චින්තන ප්‍රවේශයක්" යන ITEC වැඩසටහන සඳහා සහභාගී වූ හලාවත කලාප  අධ්‍යාපන කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ සසිජා ගයේෂිනී සිල්වා මහත්මිය නවමු ජවයකින් මව්බිම උදෙසා සේවය කිරීමට ITEC පුහුණුව අභිප්‍රේරණයක් වූ බව සඳහන් කළාය. බෙංගලාරු හි ස්වාමි විවේකානන්ද යෝගා අනුසන්ධාන සම්ස්ථාන විසින් පවත්වන ලද ITEC පුහුණු වැඩසටහනක් සඳහා සහභාගී වූ කොළඹ විශ්ව විද්‍යාලයේ චතුර්දි උදාරි විතානගේ මෙනෙවිය එය ජීවිතය වෙනස් කළ අත්දැකීමක් වූ බව සඳහන් කළ අතර යෝගා තුළින් අභ්‍යන්තරික සාමය සහ සතුට ළ   කරගැනීම සඳහා එම පුහුණුව උපයෝගී කරගන්නා බව ද පැවසුවාය. පුහුණු මොඩියුල නව තාක්ෂණයන් හා සුසංයෝග කර තිබූ බව ද  වා සමාජයට බෙහෙවින් අදාළ වන බව ද පැමිණ සිටි පිරිස සඳහන් කළේය.

6. 1964 සැප්තැම්බර් මාසයේදී  රම්භ කරන ලද ITEC වැඩසටහන ඉන්දියානු රජයේ ප්‍රමුඛතම වැඩසටහනකි. මිත්‍රශීලී, දියුණු වෙමින් පවතින රටවලට තාක්ෂණික සහයෝගය ලබා දීම සහ ධාරිතා ගොඩනැගීමට සහය වීම මෙහි අරමුණ විය. මේ වන විට රටවල් 160ක 200,000ට අධික ශිෂ්‍යත්වලාභීන් පිරිසක් සම ත් මෙම වැඩසටහන සහකාර රාජ්‍යයන්හි මානව සම්පත් සංවර්ධනයෙහිලා ඉවහල් වන වැදගත් වැඩසටහනක් බවට පත්ව  ත. සෑම වසරකම ඉන්දියානු තානාපති කාර්යාල මෙම දකුණ - දකුණ සහයෝගීතාවය ITEC දිනය ලෙස සමරනු ලැබේ.

***

කොළඹ

2022 සැප්තැම්බර් 30